# ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳව මහජන අදහස් විමසීම



## ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳව මහජන අදහස් විමසීම

2025 ජූලි මස 02 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/25/1065/802/017 ප්‍රකාරව, දැනට බලාත්මක ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සමාලෝචනය කර අවශ්‍ය සංශෝධනයන් හඳුන්වා දෙමින් නව ජාතික ජල සම්පත් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අනුමැතිය හිමි වූ අතර ඒ සම්බන්ධයෙන් පත් කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව, අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ කමිටුව සහ තාක්ෂණික කමිටුව ඒකාබද්ධව උපදේශකවරුන් දෙදෙනෙකුගේ ද සහය ඇතිව සකස් කරන ලද ජාතික ජල සම්පත් ප්‍රතිපත්ති කෙටුම්පත මහජන අදහස් විමසීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්

හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මේ වන විට අමාත්‍යාංශයේ වාරිමාර්ග අංශයට අයත් වෙබ් අඩවියේ (www.irrigationmin.gov.lk) භාෂා ත්‍රිත්වයෙන් ම පල කර ඇත.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් ගෙන් අදහස් හා යෝජනා ලිඛිතව ලබා ගැනීමට අපේක්ෂා කරන අතර ඒවා කෙටුම්පතෙහි අදාළ පරිච්ඡේදයන්ට අනුකූලව ලබා දිය යුතු ය.

සියළු අදහස් හා යෝජනා 2026.04.20 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ආකාරයට අමාත්‍යාංශය වෙත ලබා දිය හැක.

අදහස් යොමු කළ හැකි ක්‍රම:

1. විද්‍යුත් තැපෑල : waterpolicy.public@gmail.com
2. ලිපි මඟින්: ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය, අංක 500, ටී.බී.ජයා මාවත, කොළඹ 10
3. ෆැක්ස් මඟින් : 0112684053

**Click here to download the policy: English**

**Click here to download the policy: Tamil**

**Click here to download the policy: Sinhala**

**ලේකම්**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**